# කම්කරු දෙපාර්තමේන්තුව

## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

### වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වලක්වා දේශයේ ශ්‍රම සම්පත සුරකිමු.



## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

වැඩ කරන සේවකයින්ගේ සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම අප අංශයේ ප්‍රධාන වගකීමයි. එම වගකීම ඉටු කිරීමට ප්‍රධාන වශයෙන් කර්මාන්තශාලා ආඥා පනත ක්‍රියාත්මක කෙරේ. මෙම කාර්යය සාර්ථකව සිදු කිරීමට දිවයින පුරා පළාත් මට්ටමින් කොළඹ, ගම්පහ, කුරුණෑගල, රත්නපුර, මහනුවර, බදුල්ල, ගාල්ල, අනුරාධපුරය, කළුතර හා යාපනය යන නගර වල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයන් පිහිටුවා ඇත.

## අපගේ ප්‍රධාන සේවාවන්



- මරණීය සහ බරපතල අනතුරු විමර්ශනය කර එවැනි අනතුරු නැවත සිදුවීම වැලැක්වීමට උපදෙස් ලබාදීම.
- වෘත්තීය රෝග විමර්ශනය කර ඒවා වැලැක්වීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- සුරක්ෂිතතාව, සෞඛ්‍යය සහ සුභසාධනය සම්බන්ධව පරීක්ෂා කර බලා උපදෙස් ලබා දීම.
- සේවකයින් සහ වෘත්තීය සමිති මගින් ඉදිරිපත් කරන පැමිණිලි විමර්ශනය කිරීම තුළින් නිසි පිලියම් යෙදීම.
- අති අන්තරායකාරී යන්ත්‍රසූත්‍ර එනම් පීඩන භාජන සහ ඔසවන උපකරණ පරීක්ෂා කරවීම.
- කර්මාන්තශාලා හිමියන් සහ සේවකයින් අනතුරු වැලැක්වීම පිළිබඳ දැනුවත් කිරීම
- කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය කිරීම වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.

### සුරක්ෂිතතාවයෙන් බිඳක්

- යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට පෙර නිසිදැනුම ලබා දෙන්න.
- යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට පෙර එහි තත්වය සහ ආරක්ෂක ආවරණ පරීක්ෂා කරන්න.
- යන්ත්‍ර සූත්‍ර අනවසර භාවිතයෙන් වලකින්න.
- අනතුරුදායක තත්වයන් පිළිබඳ සේවකයින් දැනුවත් කරන්න.
- අනතුරුදායී ක්‍රියා පිළිබඳව සේවකයින් දැනුවත් කරන්න.

- රැකියාවේ අවශ්‍යතාවය අනුව සිදුකරන කාර්යයට ගැලපෙන පරිදි පුද්ගල ආරක්ෂක උපකරණ ලබා දෙන්න.
- අනාරක්ෂිත උස් ස්ථානවල කටයුතු කිරීමේදී ආරක්ෂක බඳපටි සහ හිස් වැසුම් ලබා දී ඒවා අධීක්ෂණය කරන්න.
- උස් ස්ථාන වලින් වැටීමට ඉඩ ඇති නම් එවැනි ස්ථාන ආරක්ෂිතව භාවිතා කිරීමට හැකිවන පරිදි සකස් කරන්න.
- බර වාහන යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට පෙර වැඩබිමේ ජීවිත හා දේපලවල සුරක්ෂිතතාවය තහවුරු කරන්න.
- අනාරක්ෂිත විදුලි රැහැන් පරිවරණය කරන්න.
- විදුලි පරිපථ නිසිපරිදි භූගත කරන්න.
- අධිබලැති විදුලි රැහැන් ආශ්‍රිතව වැඩ කිරීමේදී සුරක්ෂිත ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට උපදෙස් ලබා දෙන්න.
- අනතුරු වීමට ඉඩ ඇති ස්ථාන වලට සැමවිටම ආරක්ෂක සංඥා යොදන්න.
- නිවැරදි ඉරියව්වෙන් සහ නිවැරදි වැඩ ක්‍රම අනුගමනය කිරීමෙන් ශරීරයට වන ආපදා වලක්වා ගන්න.
- සේවා ස්ථානය පිරිසිදුව හා ක්‍රමවත්ව තබාගන්න.
- සැම විටම සේවකයන්ගේ වැඩ ක්‍රමවත්ව අධීක්ෂණය කර උපදෙස් ලබා දෙන්න.
- සේවා ස්ථානය තුල ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් ඇතිකර, හදිසි අවස්ථාවකදී කල යුතු ක්‍රියා මාර්ග පිළිබඳව පුහුණුව ලබා දෙන්න.

කර්මාන්තශාලා හා වැඩබිම්වල සිදුවන අනතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තමය සුරක්ෂිතතා අංශයට දැනුම් දෙන්න. සුරක්ෂිත සේවා ස්ථානයක් සඳහා පසුපිටේ දැක්වෙන දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල වලින් උපදෙස් ලබා ගන්න.

**සුරක්ෂිතතා සංස්කෘතියක් ඇති කර ගැනීමෙන්**
**වෘත්තීය අනතුරු සහ වෘත්තීය රෝග වලකමු**

## ප්‍රධාන කාර්යාලය

කම්කරු කොමසාරිස්
(කර්මාන්තමය සුරක්ෂිතතා) හා
ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු,
කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව
නො. 97, ජාවත්ත පාර, කොළඹ 05.
දුරකථනය : 0112508783
ෆැක්ස් : 0112508783
විද්‍යුත් තැපැල : dolisd@sltnet.lk

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය,
කොළඹ දිස්ත්‍රික්කය
කම්කරු දෙපාර්තමේන්තුව,
97, ජාවත්ත පාර, කොළඹ 05.
දුරකථනය : 0112508774

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය,
කළුතර දිස්ත්‍රික්කය
කම්කරු දෙපාර්තමේන්තුව,
131/1, පරණ පාර, කළුතර දකුණ.
දුරකථනය : 0342221752

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය,
ගම්පහ දිස්ත්‍රික්කය
කම්කරු දෙපාර්තමේන්තුව,
207, ශ්‍රී බෝධි පාර, ගම්පහ.
දුරකථනය : 0332232403

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය, වයඹ පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
දකුණු රවුම් පාර,
ගැට්ටුවාන, කුරුණෑගල.
දුරකථනය : 0372220760

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය, මධ්‍යම පළාත
කම්කරු දෙපාර්තමේන්තුව,
යටිනුවර වීදිය,
මහනුවර.
දුරකථනය : 0812225087

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය,
දකුණු පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
පහළ ඩික්සන් පාර, ගාල්ල.
දුරකථනය : 0912225778

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය, ඌව පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
96 ඒ, මහියංගනය පාර, බදුල්ල.
දුරකථනය : 0552223550

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය, උතුරු පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
සිවන්පන්නායි පාර, යාපනය.
දුරකථනය : 0212224052

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය,
උතුරු මැද පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
උසාවි පෙදෙස, අනුරාධපුරය.
දුරකථනය : 0252226798

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක
ඉංජිනේරු කාර්යාලය, සබරගමු පළාත,
කම්කරු දෙපාර්තමේන්තුව,
243, බණ්ඩාරනායක මාවත,
රත්නපුරය.
දුරකථනය : 0452232069